# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 31 දරන යුක්තිය පසිඳලීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 අගෝස්තු මස 01 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1975 අගෝස්තු මස 08 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 31 දරන**
**යුක්තිය පසිඳලීමේ (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1975 අගෝස්තු මස 01 වන දින]

එල්. ඩී.—ඕ. 17/75.

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 31 දරන යුක්තිය පසිඳලීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ 31 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්ති පිළිවෙලින් එම වගන්තියේ (4) වන සහ (5) වන උපවගන්ති වශයෙන් නැවත අංක කිරීමෙන් ; සහ

(ආ) එම වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(3) (1) වන සහ (2) වන උපවගන්තිවල ඇතුළත් විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, මේ උපවගන්තියේ කාර්යයන් සඳහා නියෝග මගින් නියම කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් යම් කිසි තැනැත්තකුට විරුද්ධව ඇති සියලු ම නඩු ඇසීමේ, විභාග කිරීමේ හා නිශ්චය කිරීමේත්, එවැනි සෑම වරදක් සම්බන්ධයෙන්, ඒ වරද සඳහා දිසා අධිකරණයක් විසින් නියම කළ හැකි දණ්ඩන නියමයකින් අඩක් නොඉක්මවන්නා වූ බන්ධනාගාරගත කිරීමේ හෝ දඩ ගැසීමේ හෝ ඒ දඬුවම් දෙකම නියම කිරීමේ හෝ දණ්ඩන නියමයක් කිරීමේත් අධිකරණ බලය මහේස්ත්‍රාත් අධිකරණයකට ඇත්තේ ය :

එසේ වුව ද මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ ඇති නඩු කටයුත්තෙහි දී ඒ තැනැත්තා චෝදනා ලැබ සිටින්නේ යම් වරදක් සම්බන්ධයෙන් ද ඒ වරද සම්බන්ධයෙන් හෝ ඒ වරද කරන ලද්දේ යම් ක්‍රියා කලාපයක දී ද ඒ ක්‍රියා කලාපයේ දී ම සිදු කරන ලද වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් හෝ ඒ තැනැත්තාට විරුද්ධව අභියෝදනාවක් තමා විසින් ඉදිරිපත් කර ඇති බව හෝ ඉදිරිපත් කිරීමට තමා අදහස් කරන බව නීතිඥවර සටහන් කිරීමට පෙර යම් වේලාවක දී

2—ඒ 15419—14,281 (75/06)

රජයේ අපරාධ නඩු අධ්‍යක්ෂ ලියවිල්ලකින් මහෙස්ත්‍රාත්වරයාට දැනුම් දුන් අවස්ථාවක, මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ ඒ තැනැත්තාට විරුද්ධව ඇති සියලු වැඩිදුර නඩු කටයුතු නතර කරනු ලැබිය යුතු අතර, එවිට, ඒ තැනැත්තා නඩු විභාගයට භාජන කිරීමේ අධිකරණ බලය මහෙස්ත්‍රාත් අධිකරණයට නැතිව යන්නේ ය.".